## පොඩි දූවගේ සිනා වැලයි

පොඩි දූවගේ සිනා වැලයි
පොඩි පුතුගේ කතා පෙලයි
ප්රිය බිරිඳගෙ සෙනේ විලයි
මගේ නිවන මගේ පැල්පතයි

කටු මැටි ගැ බිත්ති පුරා
පළිඟු මැණික් එළිය දිලේ
ගොම මැටි ගෑ ගෙබිම මගේ
පියවිලි බුමුතුරු වගේ...//

ලබන නමුත් දුක් පීඩා
කුඩු වුනොත් පුංචි පැලේ
අඹුදරුවන් අතර තුරේ
මට නිම්නැති සුවය දැනේ...//

ගායනය : සෝමතිලක ජයමහ
සංගීත නිමැවුම : ආචාර්ය රෝහණ වීරසිංහ